# ශ්‍රී ලංකාවෙන් මුළු ලෝකයටම
# ඉතිහාසයේ ප්‍රථම කාන්තා අගමැතිනිය
# සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මිය

> "ඇතැමුන් විසින් සිතනු ලබන පරිදි,
> විමුක්තිය සහ සමානාත්මතාවය
> ප්‍රධාන වශයෙන්ම අඩංගු වන්නේ
> ප්‍රජාතන්ත්‍රවාදයේයි. එසේනම්,
> ඒ හර පද්ධතිය ඉතාම හොඳින්
> ලද හැකිවන්නේ, හැම කෙනෙකුටම
> මුළුමනින්ම, සමාන මට්ටමෙන්
> පාලනයෙහි කොටස්කරුවන්
> විය හැකිවූ විටයි."
> ඇරිස්ටෝට්ල් (ක්‍රිස්තු පූර්ව 384 – 322)
> මහා ග්‍රීක දර්ශනවාදියා

ඉතා මැදහත් ලෙස ,ඉතිහාසය පුනරාවර්ජනය කරන කල්හි, හොඳින්ම පැහැදිලිව අවබෝධ වන කරුණක් වෙයි. ඒ කරුණ නම්, ශ්‍රී ලංකවේ මෑත ඉතිහාසයෙහිදී, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය රටේ අගමැති පදවියෙහි සිටි කාලපරිච්ඡේදය උච්ච මට්ටමෙන් ඉස්මතුව නැඟී සිටින යුගයක් බවයි.

මේ උදාර ශ්‍රී ලංකා ද්වීපයෙහි ,වරින්වර, විචිත්‍ර දේශපාලනික පුද්ගලයන් රැසක් විසින්ම, අගමැති පදවිය නම් උත්තරීතර තනතුර උසුලමින්, මේ දේශය බබුලුවන ලදී.

අගමැතිවරුන් වශයෙන්, ශ්‍රී ලංකා දේශය නම් නෞකාව පැදවූ විශිෂ්ඨ පුද්ගලයන් සියළු දෙනා අතුරින්, සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනිය තරමට ප්‍රබල අභියෝගයන්ට මුහුණ දුන් වෙන අන් නායක කෙනෙක් නොමැත.

මා මෙම ප්‍රකාශය කරන්නේ මති මාත්‍රවූ හෝ අතිශයෝක්තියකින් තොරවයි.

ආරම්භයේදී, ඉතා සුළු හෝ දේශපාලන තනතුරක් ඉසිලීමේ අදහසක්, යාන්තමට හෝ එතුමියගේ සිතෙහි නොතිබුනේය.

අතිශය ක්‍රියාශීලී වූත්, තියුණු බුද්ධි මහිමයක් සහිත වූත්, සිය දේශපාලනික ස්වාමි පුරුෂයානන්ට බැතිමත්ව සහයෝගී වීමෙන්, එතුමිය අත්‍යන්තයෙන්ම තෘප්තිමත් වූවාය. එතුමිය, සිය ස්වාමිපුරුෂයාණන්ගේ ප්‍රඥාසම්පන්න පරිපාලන විශාරදත්වයට ගරු කළා ය.

එතුමා අදිසියේ, කිසි සේත් නොසිතූ පරිදි අභාවයට පත් වීමේ දැඩි ඛේදවාචකය, එතුමියට දරාගත නොහෙන කම්පාවක් වූයේ ය. ඒ කම්පනය හේතුකොට ගෙන එතුමිය, කිසිවක් කර කියා ගත නොහෙන අකර්මන්‍ය තත්වයකට පත්වූවා ය. සිය ශ්‍රේෂ්ඨ ස්වාමිපුරුෂයාණන්ගේ සෙවන නොලැබ තමන්ගේ ආදරණීය දරු පවුල බලා ගන්නේ කෙසේදැයි යන චේතනා මාත්‍රයෙන්මඑතුමිය අසරණ වුවා ය.

එසේ වුවද, දේශයේ මහජනකාය නියෝජනය කරමින් රටේ නායකයෝ එතුමිය හමුවන්නට පැමිණියහ. එතුමියගේ ශ්‍රේෂ්ඨ ස්වාමිපුරුෂයානන්ගේ වියෝගය නිසා ,යන එන මං නොදන්නා තත්වයකට පත්ව සිටින, මේ දේශයේ නායකත්වය ගන්නැයි ඔවුහු එතුමියට කියා සිටියහ. අයැදියහ. ඉල්ලා සිටියහ.

අන්තිමේදී, කඳුලින් බර දෙනෙත් සහිත අසරණ ජනතාව පිළිබඳ මානව දයාව එතුමියගේ හදට දැනුනේ ය. වැළපෙන හදින් මනසින්, එතුමිය නායකත්වය සපයන්නට එකඟ වූවා ය. ඒ ක්‍රියාව ඉටු කළේත් එතරම්ම කැමැත්තෙනුත් නොවේ.

මේසා අසහාය අවස්ථාවක ක්‍රියාශීලී දේශපාලන ක්ෂේත්‍රයට අවතීරණ වූ හැටියේම, මුළු ලෝකයේම ,අගමැති පදවි ලද ප්‍රථම කාන්තාව වීමේ සම්මානික භාග්‍යමය තත්වය එතුමියට ජගත් ව්‍යාප්තව පිරි නැමුනේ ය. ඒ, 1960 ජූලි මස 21 වන දායි.

එතුමිය පදවි ප්‍රාප්ත වූයේ ඉතා බොහෝ සුභ, සුහද හැඟීම් සහිත පසුබිමක ය.

එසේ වුවද, අගමැතිනිය වශයෙන් ඇයට මුහුණ පාන්නට සිදු වූයේ හැමතින්ම ආලෝලනයට පත්ව තිබුණු දේශපාලන පසුබිමකට ය.

එතුමියගේ ස්වාමිපුරුෂයානෝ සම්ප්‍රදායික දේශපාලනයෙන් වෙන්වී නවපරිපාලන ප්‍රතිපත්ති රටාවක් ජනතාවට පිරිනැමූහ.

එතුමාගේ රාජ්‍ය පාලන ප්‍රතිපත්තිය, ප්‍රජාව දෙසට බොහෝ සේ නැඹුරු වූ ක්‍රමාවලියක් වූයේ ය.

එතුමා, කල්තියාම අවබෝධ කොට ගෙන සිටියේ, තමා විසින් ඉදිරිපත් කරන ලද පාලන ක්‍රමයෙහිදී හැම කෙනෙකුටම සහ මුලින්ම සහභාගී විය හැකි බවත්, ඒ පාලන න්‍යායයේ ප්‍රතිඵල සියලු දෙනාටම සමසේ භුක්ති විඳිය හැකි බවත් ය.

එතුමාගේ ගැඹුරු දේශපාලන දර්ශනය නිසා හටගත් ප්‍රතිඵලය, සංක්‍රාන්ති කාල පරිච්ඡේදයකැයි කියන සුලභ කියමනෙන් විස්තර කළ නොහැක.

ඒ පාලනය නිසා හටගත් විකාශනය, එයට වඩා බොහෝ සේ ගැඹුරු වූයේ ය. ඒ වෙනස් වීම මහා ප්‍රවාහයක ස්වරූපය ගත්තේ ය. එහි කම්පන රැල්ල, මුළු දිවයින පුරාම සියලුම සමාජ තලවලට දැනුනේ ය.

එය බලපෑවේ, සම්මත දේශපාලනික ක්‍රියා කලාපය කෙරෙහි පමණක් නොවේ. ඒ වෙනසෙහි දෙදරුම නිසා හටගත් නව දේශපාලන දර්ශනය, දේශයේ ආගම, කලාව ,සාහිත්‍යය, අධ්‍යාපනය ආදි ක්ෂේත්‍ර වලටත් දැනුනේ ය. වෙනෙකක් තබා, සාමාන්‍ය මහජනතාව “නිදහස” ගැන සිතන ආකාරය පවා වෙනසකට භාජන වූයේ ය.

කෙටියෙන් කිවහොත්, එය ප්‍රබල ජන ආලෝලනයක් විය.

එසේ වුවද, එපමණ විභූතිමත්, එතරම් බල සම්පන්න සාමාජික විපර්යාසයක් තනා ලූ මහා පුරුෂයා ලොවින් තුරන් වූ විට, වෙසෙසින්ම සිය මහා මානව මෙහෙයෙන් අඩක් තරම ඉතිරි කොට, ජීවිතයෙන් ඉවත්ව ගියවිට, ඒ මහා විපර්යාසයේ උරුමක්කාරයා වන පුද්ගලයාට අනිවාර්යයෙන්ම දැනෙන්නේ, තමා හිටි හැටියේ අසරණ, අකර්මන්‍ය තත්වයකට පත් වූ සේ ය.

ඉතා හොඳට ඒ උරුමය පරිහරණය කරන්නට පුහුණු වූ කෙනෙකුට වුවද, එවැනි හදිසියකට මූණපෑම අතිශයින්ම අපහසු ය.

එසේ වුවද, විස්මය දනවන ආධ්‍යාත්මික ශක්තියක් ප්‍රදර්ශනය කරමින්, අගමැතිනි සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මිය, ඒ එළඹි අර්බුදයට, නොබා අවලව මූණ පෑවාය. එසේ මූණපාමින් එතුමිය, ශ්‍රී ලංකා ඉතිහාසයෙහි අත්‍යන්තයෙන්ම බලාපොරොත්තු සහිත යුගයක් උදා කළා ය.

සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනිය, සිය පාලන සමය ආරම්භ කළවිට, දේශීය ප්‍රශ්න පද්ධතියක් එතුමියගේ න්‍යාය පත්‍රයට ඇතුල් වූයේ ය. එය එසේ වූයේ, කවර රජයක් විසින් වුවද, අනිවාර්ය වශයෙන් සැළකිය යුතු වන්නේ, දේශීය ප්‍රශ්න වලට ප්‍රමුඛත්වය ආරෝපනය කිරීම හෙයිනි. මක්නිසාද යත් දේශීය අවශ්‍යතා ක්ෂණිකව ඉෂ්ට කළයුතු දේ බවට , නොපමාව පත්වන හෙයිනි.

සිය දේශීය ප්‍රතිපත්ති මාලාව සකස් කිරීමෙහිදී, සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනිය විසින් පිළිපදින ලද දේශපාලන නැඹුරුවීම් වල සහ ආකල්ප වල ගුණාත්මක බව, ප්‍රශංසනාත්මක අගයකින් හා ස්ථාවරත්වයකින් හෙබි වූයේ ය. මේ බව, අවිවාදයෙන් නොපිළිගන්නා කිසිවෙකු නොමැති බව, පූර්ණ සත්‍යයකි.

එතුමියගේ, සුවිශිෂ්ට, අසහාය පරිපාලනය සතුව තිබුණු දිදුළ හා විභූතිය වඩාත් ඉස්මතුව ප්‍රදර්ශනය වූයේ , එතුමිය විසින් ජගත් කීර්තිය අත්පත් කොට ගනිමින් ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය සිට ආධිපත්‍යයෙන් දීප්තිමත් කළ හෙයිනි.

මැදහත්ව, අපගේ ඓතිහාසික වංශ කථාවට යා කළ යුතු කරුණක් වෙයි. ශ්‍රී ලංකා ඉතිහාසය මුළුල්ලේ වෙන අන් කවර අගමැති කෙනෙකුට වුවද, එතරම් සංකීර්ණ විදේශ

ප්‍රතිපත්තියක් ක්‍රියාවේ යොදවන්නට කරුණු යෙදුනේ නොවේ. වෙසෙසින්ම, එතුමියට සිය විදේශ ප්‍රතිපත්තිය හසුරුවන්නට සිදු වුනේ මේ දේශයට පුළුල් ලෙස ව්‍යාප්ත වූ අන් කිසි යුගයෙක හෝ සිදු නොවූ විරූ අධිනාශක දරුණු ක්‍රියා ප්‍රවාහයකින් වධ වේදනා විඳ දරාගන්නට සිදු වූ යුගයකයි.

මේ පාලන සමය , වර්තමාන ළමා හා යොවුන් පරපුර විසින් අප්‍රතිහත ලෙස අධ්‍යයනය කළ යුතු කාල පරිච්ඡේදයකි. සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනියගේ , අත්‍යන්තයෙන්ම ආදර්ශමත් පාලන යුගය පිළිබඳව නිසි, ක්‍රමවත් පිළිඹුවක් ලද හැකි වන්නේ , එවැනි තියුණු අධ්‍යයනයෙකින්ය.

තමන් සතු සිතිය නොහෙන තරම් පරිණත පාලන තන්ත්‍ර ඥානය, ලොව හමුවේ ප්‍රකාශ කරමින් එතුමිය විසින් ආයුධ සන්නද්ධ කුමන්ත්‍රණයක් ව්‍යර්ථ කරන ලදී. ඒ කුමන්ත්‍රණය, පෘථුලාකාරයෙන් සංවිධානය කොට තිබුණේ මුළු මහත් පාලන පද්ධතියම විනාශ කිරීමේ අරමුණෙනි. විනාශගත කිරීම සඳහා ඉලක්ක වශයෙන් සැලසුම් කොට තිබූ ප්‍රධාන පුද්ගලයන්ගේ ලේඛනයෙහි මුලින්ම සිටියේ ,අගමැතිනියයි. මේ 1962 ජනවාරි මාසයේ යි.

එතුමියගේ පාලන සමයේදී, එතුමියට මූණ පාන්නට සිදු වූ ප්‍රබල ජීවිතයත් - මරණයත් අතර, අභියෝග ඉන් නිමා නොවූයේ ය.

ජීව විනාශය සඳහා ආවේග ඇතිවන තරමට ආවේශ ගන්වන ලද, අධි දාමරික විප්ලවකාරී කල්ලියක් පැන නැංගේ ය. ඉවක් බවක් නැතිව ජනතාව උසිගන්වන දුර්දාන්තයෝ, මතිමාත්‍ර වූ හෝ අනුකම්පාවකින් තොරව, අහිංසක යොවුන් පිරිසකගේමොළ විකල් කොට ඔවුන් මරණය, විනාශය හා නැති හංග කිරීම දෙසට ඇද දැමූ හ. මේ නපුරෝ ඝාතන, වධ හිංසා කිරීම් කොල්ලකෑම්, ගිනි තැබීම් ආදී අත්‍යන්ත නාශක අපරාධ ප්‍රමාණයක් මේ උදාර දේශයේ ඇති කළහ.

මේ අමානුෂික බලවේගයේ එක් මූලික ඉලක්කයක් වූයේ සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනිය යි. ශ්‍රී ලංකා ඉතිහාසයේ වෙන අන් කිසිම කලෙක මෙසේ, මුළාවෙන් වල්වැදුනු ඝාතක නාශක රැල්ලක් සිදු වූයේ නොවේ. මුළු මහත් දේශයේම දිවි පෙවෙත අත්හිටියාසේය. ජන ජීවිතයට දරුණු තර්ජන එල්ල වූයේ ය. නීතිය හා සාමය පිළිබඳ ආයතන අන්තරායට ලක්වූ හ.

ඓතිහාසික වශයෙන් මෙහිදී ජාතික මට්ටමෙන් වංශකථා ගත විය යුත්තේ, මේ විෂඝෝර නාශක ප්‍රහාරය, තමන් වෙත එල්ලවී තිබිය දී, ජීවිතයත් මරණයත් අතර දෝලනය වෙමින්, අකම්පිතව, අචලව සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිණිය ජාතියේ ,දේශයේ ආරක්ෂාවට දිවි නොතකා කැපවූ ආකාරය යි.

අපගේ මේ උදාර දේශයේ ළමා හා යොවුන් පරපුරේ දරුවෝ, සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනියගේ මේ විශිෂ්ට පාලන ව්‍යායාමය ගැන නිසි සේ අවබෝධ කොට ගත යුතු වෙති. බලාපොරොත්තු, අනාගතය, ජීවිතය ආදී සියල්ල මරණය පිළිබඳ ඝන තිමිර පටලයෙන් ආවරණය වී තිබුණු සමයක, එතුමිය විසින් දේශයේ සාමය, සුහද ජන ජීවිතය,

රැක ගන්නා අදහසින් ඉටුකළ මහ මෙහෙය, දේශයේ හැම දෙනෙකු විසින්ම බහුමානයෙන් අගය කළ යුතු වේ . අපගේ යොවුන් පරපුර විසින්, ඒ මහා සේවය විශේෂයෙන්ම සිහිපත් කළයුතු වන්නේ ය.

ඉතිහාසය ඔස්සේ එල්ල වූ ඒ කර්කශ තර්ජන වලට එරෙහිව, අප්‍රතිහත ධෛර්යයෙන් නැඟී සිට, දේශය විනාශයෙන් ගලවා ගත හැකි වූයේ එතුමිය සතු ප්‍රබල ආධ්‍යාත්මික ශක්තියත්, රට, ජාතිය, ආගම වෙනුවෙන් සියල්ල කැපකිරීමේ ආත්ම ත්‍යාගී ශක්තියත් හේතු කොට ගෙනය.

එතුමිය හමුවේ මේ මහා තර්ජන හිස ඔසොවා සිටියේ එක එක නොවේ. සමූහ වශයෙනි. මොහොතක්වත් සිත සනසාගෙන සිය බැරෑරුම් වගකීම් සම්භාරයට යොමුවීම පවා මහා වික්‍රමයක්ව තිබුනු කාලපරිච්ඡේදයකය.

මුලින්ම, එතුමියගේ ජීවන ශක්තිය බිඳලන්නට එල්ල වුණු මාරකයකට සමාන ප්‍රහාරය වූයේ සිය ශ්‍රේෂ්ඨ සැමියා ඝාතකයෙකුගේ වෙඩි පහරින්, ජීවිත හානියට ලක්වීමේ ඛේදවාචකය යි. අවි ගත්තවුන්ගේ කුමන්ත්‍රණය, ඊගාවට එතුමියගේ ආත්මය තළා පෙළා ලූයේ ය.

එහි ගින්න නිවෙන්නට පෙරම පාහේ අවිචාරී, නාශක අවිධාරීන්, දේශය විනාශ කිරීමේ මාරක ප්‍රයත්නයක යෙදුනේ, කිසිම විකල්පයක් නැතිවන තරමට, එතුමියගේ පාලනය සුන්බුන් කරමිනි.

එවැනි බියකරු පසුබිමක් තිබියදී ,ඉතාම කෘතහස්ත පාලන වේදියෙකු වුවද, අන්ත අසරණ තත්වයට ඇද වැටෙනු ස්වාභාවිකය.

ඒ අන්ධකාර අගාධයෙන් ගොඩට වුත්, සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනිය, අසහාය ආත්ම ශක්තියක වික්‍රමය, ජගත් මට්ටමෙන් ප්‍රදර්ශනය කොට සිටියාය.

මේ ක්‍රියාදාමය ප්‍රකාශයට පත්වූයේ නොබැඳි සමුළු රාජ්‍ය නායකයන් 86දෙනෙකු සහභාගී කොට ගෙන කොළඹදී පවත්වන ලද “නොබැඳි සමුළුවේ රාජ්‍ය නායකයන්ගේ ඉහළ මට්ටමේ“ හමුවේදීය. මේ රැස්වීම සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනියගේ ප්‍රධානත්වයෙන් 1976 අගෝස්තු 16 වන දා සිට 1976 අගෝස්තු 20 වන තෙක් පැවැත්තේ ය.

මේ සා භාරදූර , මහා පරිමාණයේ ජාත්‍යන්තර මහ සමුළුවක් ,රාජ්‍ය 86 ක නායකයන් සහභාගි කරවා ගනිමින් පවත්වන්නට අවශ්‍ය වන ප්‍රබල සංවිධානාත්මක ක්‍රියාදාමයේදී පෙරමුණ ගන්නා ලද්දේ අගමැතිනිය විසිනි.

මෙය හුදෙක්, අසහාය ජාත්‍යන්තර සබඳතා පිළිබඳ විස්මය උපදවන ජයග්‍රහනයක් පමණක් නොවේ. මෙය, ඒ වන විට ජාතික හා පෞද්ගලික අර්බුද රැසකට ,අනභිබවනීය ලෙස මුහුණ පා සිටි සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනියගේ, විශිෂ්ඨ පෞද්ගලික ජයග්‍රහනය ද වන්නේ ය.

මේ කොළඹ නොබැදි රාජ්‍ය නායක සමුළුවේ බලපෑම, එක්සත් ජාතීන්ගේ සංවිධානය ඔස්සේ ජගත් ජන මණ්ඩලයේ සියළු ප්‍රදේශවලටම පාහේ පැතිර ගියේ ය.

මේ කොළඹ මහා රාජ්‍ය නායක සම්මේලනයේ තීරණ වලට අනුව, එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් විවිධ අණ පනත් හා යෝජනා සම්මත කොට ගන්නා ලදී.

ශ්‍රී ලංකාවේ වර්තමාන යොවුන් පරපුරට අයත් දරු දැරියන්, තරුණ තරුණියන්, සියලු දෙනාම සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනියගේ උදාර දේශීය හා ජාතික මෙහෙයෙහි වර්තමාන උරුමක්කාරයෝ වෙති.

එනිසා එතුමියගේ ජන්මයෙන් සියවස සපිරෙන මොහොතේ දී මේ ජාතික නායිකාව විසින් ඉටු කරන ලද ප්‍රශස්ත මෙහෙය , ඉතා, හොඳින් අධ්‍යයනය කොට ඉන් ලද හැකි, ආලෝකය ලබා ගැනීම අපගේ ජනතාව සතු වෙසෙසින්ම ළමා හා යොවුන් පරපුර සතු උත්තරීතර වගකීමක් වෙයි.

සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිතුමියගේ පාලන සමය තුළදී, එතුමිය විසින් පිහිටුවා ලන ලද පාලන වාර්තා බොහෝ ය. ඒවා සවිස්තර ලෙස විමසා බලා උගෙන ගැනීම, වර්තතමාන පරපුර සතු ශ්‍රේෂ්ඨ වගකීමකි. එතුමියගේ අසහාය පාලන ජයග්‍රහනයන් අතුරෙන් අතළොස්සක් සැකෙවින් හෝ සටහන් කළ යුතු වේ.

දිගු කලක් මුළුල්ලේ අපේ රටේ නායකයන්ට බිම් අඟලක් හෝ දිනාගත හැකි නොවීය.

එහෙත් ,සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනිය, අතිශයින් සාමකාමී ලෙස, ක්‍රමානුකූලව ගිවිසුම් මගින් ශ්‍රී ලංකාවට නව බිමක්- එනම්, "කච්චතිව්" පෙදෙස ලබා ගත්තාය. මේ බිම් පෙදෙස ශ්‍රී ලංකාවට ලැබුනේ ඉන්දු ලංකා ගිවිසුමකිනි. මේ ගිවිසුමට ඉන්දියාව වෙනුවෙන් අත්සන් තබන ලද්දේ ඉන්දීය අගමැතිනි ඉන්දිරා ගාන්ධි මැතිනිය විසිනි.

ඒ ගිවිසුමෙන් කච්චතිව් පෙදෙස සිරිමාවෝ අගමැතිනිය විසින් ශ්‍රී ලංකාවට ලබාගන්නා ලද්දේ 1972 මැයි 22 වන දායි.

තවත් අත්‍යාන්තයෙන්ම වංශ කතා ගත යුතු කරුණක් කෙටියෙන් හෝ පැවසිය යුතු වේ. එතුමියගේ පාලන සමයේදී එතෙක් ශ්‍රී ලංකාව සතුව තිබූ බ්‍රිතාන්‍ය යටත්විජිත වාදී නාමය වන "සිලෝන්" යන නාමය ඉවත්ව ගොස් "ශ්‍රී ලංකා" යන නාමය උදා වූයේ ය.

අපගේ ළමා හා යොවුන් පරපුර සතු පූජනීය යුතුකම නම්, මේ ක්ෂේත්‍රයේ ශ්‍රී ලාංකික නායිකාව වන සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනිය විසින් අපගේ දේශීය ඓතිහාසික සම්ප්‍රදායේ පෝෂණය සඳහා, විවිධ අභියෝග ඉදිරියේ නොසැලෙමින් ඉටුකෙරුණු සම්භාවනීය අධි මෙහෙය පිළිබඳව පූර්ණ අවබෝධයෙන් යුක්ත වෙමින් එතුමියට සදා කෘතඥතා පූර්වක වීමයි. මේ යුතුකම , ඉතා හොඳින් ඉටුකළ හැක්කේ එතුමියගේ ජන්ම ශත සංවත්සර දිනය වන 2016 අප්‍රේල් 17 වන දා ආශ්‍රිතවයි. මේ ජන නේතෘවරිය විසින් විහිදාලන ලද ආලෝක කදම්බය , ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රගතිගාමී මාර්ගය හෙළි පෙහෙළි කරන විභූතිමත් ප්‍රදීපයක් වේවා.